# මහින්ද රාජපක්ෂ විද්‍යාලයය, හෝමාගම.

## දෙවන වාර පරීක්ෂණය - 2013

## චිත්‍ර කලාව

## 6 ශ්‍රේණිය

කාලය - පැය 2 යි

| | |
|---|---|
| I පත්‍රය | |
| II පත්‍රය | |
| එකතුව | |

නම: ........................................................................................ පන්තිය: ...................................

### I කොටස

★ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

★ පහත සඳහන් ප්‍රකාශන සත්‍ය නම් (✓) ලකුණද අසත්‍ය වේ නම් (×) ලකුණද යොදන්න.

1. නන්දි ගවයාගේ රුව නිර්මාණය වී ඇත්තේ දේවස්ථාන තුලය. ( )
2. හින්දු ආගමික ගොඩනැගිල්ලක ප්‍රධානතම අංගය වනුයේ ගෝපුරයයි. ( )
3. ඉන්දියාවේ සාංචි ස්තූපයේ ''හර්මිකාව'' යනුවෙන් හඳුන්වන කොටස් ශ්‍රී ලංකාවේ චෛත්‍යයේ ධාතු ගර්භයයි. ( )
4. රාමසාන් උත්සවය හින්දු බැතිමතුන්ගේ ප්‍රධාන ආගමික උත්සවයයි. ( )
5. නිල්, කහ, කොල යනු මූලික වර්ණයන්ය. ( )

★ පහත සඳහන් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) පලන්ඩාකාර චෛත්‍යයක හැඩය වනුයේ
   1. පාත්‍රයක හැඩය යි
   2. ලූනු ගෙඩියක හැඩය යි
   3. කණුවක හැඩය යි
   4. දිය බුබුලක හැඩය යි

2) කොලජ් චිත්‍රයක් යනු -
   1. පැන්සල පමණක් භාවිතා කර චිත්‍ර ඇඳීමය.
   2. චිත්‍රයක් නිර්මාණය කිරීමේදී විවිධ වර්ණ භාවිත කිරීමය.
   3. චිත්‍රයක දිග පළල පෙනෙන සේ නිර්මාණය කිරීමය.
   4. කොල කැබලි වැනි ද්‍රව්‍ය අලවා චිත්‍ර නිර්මාණය කිරීමය.

3) කෝලම් රටා නිර්මාණය කරනු ලබන්නේ
   1. කෝවිල් තුළ ය 2. පල්ලි තුළ ය 3. පන්සල තුළ ය 4. දේවාල තුළ ය

4) කෝලම් රටා නිර්මාණය කිරීම සඳහා යොදාගන්නා මාධ්‍යයක් නොවන්නේ,
   1. සහල් 2. පොල් කුඩු 3. දහයියා 4. පරිප්පු

5) පර්යාවලෝකනය යනු

1. වස්තුවක් මතට එලිය - අඳුර වැටීම පෙන්වීම.
2. චිත්‍රයක් ඇඳීමේදී ත්‍රිමාණ බව පෙන්වීම.
3. චිත්‍රයක් ඇඳීමේදී ළඟ - දුර පෙන්වීම.
4. හැඩතල පමණක් භාවිතා කර චිත්‍ර ඇඳීම.

★ හිස්තැනට සුදුසු වචනය ලියන්න.

1. තෛපොංගල් උත්සවය .............................. භක්තිකයන්ගේ ආගමික උත්සවයකි.
2. දම් වර්ණය සාදා ගැනීම සඳහා .............................. හා .............................. වර්ණ දෙක භාවිතා කරයි.
3. මරිය තුමිය ..............................ට පැමිණි අවස්ථාවේ ගව මඩුවක් තුළ ජේසු කුමරුන් උත්පත්තිය ලැබීය.
4. බුබ්බුලාකාර චෛත්‍යයකට උදාහරණයක් ලෙස .............................. චෛත්‍යය නම් කල හැකිය.
5. හින්දු ආගමික සංකේතය වන්නේ .............................. යි.

★ පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. පහත දී ඇති රූපයේ දැක්වෙන චෛත්‍යයේ හැඩය නම් කරන්න.



..............................................................

2. පහත පෙන්වා ඇති කොටස් 2 ක සඳහන් කරන්න.

.................................... ⟶

.................................... ⟶



3. කෝලම් රටාවක් නිර්මාණය කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

4. නත්තල් උත්සවයේදී සිදු කරනු ලබන යහපත් ක්‍රියාකාරකම් 2 ක් ලියන්න.

.............................................................................................................................

.............................................................................................................................

5. වෙසක් උත්සවයේ දැකිය හැකි සැරසිලිමය අංග 2 ක් සඳහන් කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

## II කොටස

★ පහත මාතෘකා අතරින් එකක් තෝරාගෙන වර්ණ කරන්න.

1. මගේ මල් වත්තට ආ කුරුල්ලන් හා සමනලයින්.
2. අවුරුදු දවසේ අපේ ගෙදර.
3. කුඹි ගමේ මඟුල් ගෙදර (කාටූන් ක්‍රමයට)
4. මල් කොල හැඩ ඇසුරෙන් මේස ඇතිරිල්ලකට මෝස්තරයක් නිර්මාණය කරන්න.
5. ළමා කතා පොතකට සුදුසු පොත් පිටකවරයක් නිර්මාණය කරන්න.